“මුස්ලිම්වරයා මිනීවල තුළ ප්රශ්න කරනු ලබන විට ‘නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවටත් මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවටත් සාක්ෂි දරයි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අල් බරා ඉබ්නු ආසිබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “මුස්ලිම්වරයා මිනීවල තුළ ප්රශ්න කරනු ලබන විට ‘නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවටත් මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවටත් සාක්ෂි දරයි." එහි උත්තරීතර අල්ලාහ්ගේ
ප්රකාශය මෙසේය: “විශ්වාස කළවුන් ස්ථාවර ප්රකාශය තුළින් මෙලොව ජීවිතයේ මෙන්ම මතුලොවෙහි ද අල්ලාහ් තිරසාර කරනු ඇත.” (ඉබ්රාහීම්: 27) [صحيح] [متفق عليه]

මුඃමින්වරයා මිනීවල තුළ ප්රශ්න කරනු ලබනු ඇත. එහි ඔහුගෙන් විමසා සිටිනුයේ හදීස් ගණනාවකම නම් කර ඇති පරිදි ඒ සඳහා භාරකරන ලද මලක්වරුන් දෙදෙනා වන මුන්කර් හා නකීර් විසිනි. එවිට අල්ලාහ් හැර වෙනත් දෙවිඳෙකු නොමැති බවත් සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවත් ඔහු සාක්ෂි දරනු ඇත. අල්ලාහ් පවසා ඇති පරිදි මෙය ස්ථාවර වදනක් බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්රකාශ කළහ. “විශ්වාස කළවුන් ස්ථාවර ප්රාකාශය තුළින් මෙලොව ජීවිතයේ මෙන්ම මතුලොවෙහි ද අල්ලාහ් තිරසාර කරනු ඇත.” (සූරා ඉබ්රාහිම් : 27)

https://sunnah.global/hadeeth/si/show/4206